ශ්‍රී ලංකා 1 :50,000 භූ ලක්ෂණ සිතියම්

භූගෝල විද්‍යාව

11 ශ්‍රේණිය

9 පාඩම

M.රමිශා මාහර

කෑ /දෙහි / මියනවිට කණිෂ්ඨ විද්‍යාලය

දැරණියගල

භූ ලක්ෂණ සිතියම්

- කිසියම් ප්‍රදේශයක භූ දර්ශනය අධ්‍යනයට භූ ලක්ෂණ සිතියම් ඉතා වැදගත් වේ.

භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන ලක්ෂණ

භෞතික ලක්ෂණ

- ජලවහනය
- වෙරළ ලක්ෂණ
- ස්වභාවික වෘක්ෂලතා
- භූ විෂමතා ලක්ෂණ

සංස්කෘතික ලක්ෂණ

ජනාවාස

ප්‍රවාහන මාර්ග

භෝග වගාවන්

භූ ලක්ෂණ සිතියම් කොටසක්.



සමෝච්ච රේඛා

- 1:50,000 සිතියම්වල මෙම භූ ලක්ෂණ නිරූපණයට සමෝච්ච රේඛා යොදා ගනී. (කඳුවැටි / සානු /කපොලු / තැනිතලා)

- සමෝච්ච රේඛා යනු යම් ප්‍රදේශයක උස මැන සමාන උස තැන් යා කරමින් නිර්මාණය කරනු ලබන රේඛාය.

- සමෝච්ච රේඛා අන්තරය 20 m කි.





- 100,200 ,300 වැනි මුලික සමෝච්ච රේඛා තද දුඹුරු පැහැයෙන් ද 20m අන්තරය ඇති අතරමැදි සමෝච්ච රේඛා ලා දුඹුරු පැහැයෙන් ද දක්වා තිබේ.

- සමෝච්ච රේඛා බහුලව විහිදෙන කඳුකර ප්‍රදේශවල 100,200,300 m වැනි මූලික සමෝච්ච රේඛා පමණක් නම් කර තිබේ.

- ඒ මූලික රේඛා අනුව රේඛා 2 ක් අතර අන්තරය අනුව අතරමැදි සමෝච්ච රේඛාවල අගය තීරණය කල හැකිය.





1. භූ විෂමතා ලක්ෂණ

පෘථිවිය මත ඇති විවිධ භූ රූප ලක්ෂණ භූ විෂමතා ලෙස හඳුන්වයි.

- තැනිතලා
- රැළි බිම්
- උස් බිම්
- නිම්න හා නෙරු
- කඳුවැටි / හෙල්වැටි
- හුදකලා කන්ද /කොත් කන්ද
- බෑවුම්
- කපොල්ල

භූ විෂමතා ලක්ෂණ හඳුනා ගැනීම.

1.තැනිතලාව

- සමෝච්ච රේඛා දෙකක් අතර පරතරය විශාල වීම / සමෝච්ච රේඛා කිහිපයකට පමණක් සීමා වීම මඟින් තැනිතලා බිමක් හඳුනාගත හැකිය.
- මෙම ප්‍රදේශවල තැනින් තැන දක්වා ඇති ස්ථානීය උස / තැන් උස ආධාරයෙන් තැනින් තැන වෙනස්වන උස දැන ගත හැකිය.



2.රැළි බිම

- තැනිතලා ප්‍රදේශයක දක්නට ලැබෙන මද උස් බිම් හා පහත් බිම් වලින් යුතු ප්‍රදේශ රැළි බිම් වේ.
- ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත ප්‍රදේශවල බහුලව මෙම ලක්ෂණය දක්නට ලැබේ.
- පුළුල් අන්තරය ඇති සමෝච්ච රේඛා දෙකක් අතර කුඩා උස් බිම් දැක්වෙන සමෝච්ච රේඛා මඟින් රැළි බිම් හඳුනාගත හැකිය.





3. උස් බිම

- ප්‍රදේශයක ඇති උසින් වැඩි බිමක් උස් බිමක් වේ.
- සමෝච්ච රේඛා බහුලව මෙන්ම ආසන්නව ද විහිදී ඇත.
- කඳු , සානු , නේරු වැනි ලක්ෂණ දැකගත හැකිය.



4.නිම්නය

- උස් බිම දෙසට සමෝච්ච රේඛා විහිදී තිබීමෙන් හඳුනා ගත හැකිය.
- උස් බිම් දෙකක් අතර බොහෝ විට ගංගා ආශ්‍රිතව පිහිටි දිගැටි හැඩයෙන් යුතු පහත් බිමකි.
- උස් බිම් - පටු ගැඹුරු නිම්න
- තැනිතලා - ඉතා පුළුල් නොගැඹුරු නිම්න





5.නෙරුව

- උස් බිමක සිට පහත් බිම දෙසට නෙරා ගොස් ඇති භූ ලක්ෂණයි.







6.කඳුවැටිය

- මුදුන් කිහිපයකින් සමන්විත පටු දිගටි හැඩයෙන් විහිදෙන උසින් වැඩි ප්‍රදේශ කඳුවැටි වේ.
- ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ මෙවැනි කඳුවැටි බහුලව දක්නට ලැබේ.
- කඳු වැටියක මුදුන්වල උස ත්‍රිකෝණමිතික ලක්ෂණයෙන් දක්වයි.





7.හෙල්වැටි

- තැනිතලා බිම් ආශ්‍රිතව ඇති උසින් අඩු එකදිගට විහිදී ඇති උස් බිම් හෙල්වැටි වේ.



8.හුදකලා කන්ද

- තැනිතලා බිම්වල තැනින් තැන හුදකලාව පිහිටි උසින් අඩු කඳු ප්‍රදේශය.
- මේවා 100 -200 m පමණ උස වේ.



9. කොත් කන්ද

- හුදකලා කන්ද කොතක හැඩයෙන් පිහිටි විට එය කොත් කන්දකි.
- සමෝච්ච රේඛා වෘත්තාකාරයෙන් පිහිටා ඇත.





10.බෑවුම්

- මද බෑවුම් හා දළ බෑවුම්
- උත්තල බෑවුම
- අවතල බෑවුම
- මොහොර බෑවුම

සමෝච්ච රේඛා අතර පරතරය හා ස්වරූපය අනුව විවිධ බෑවුම් හඳුනාගත හැකිය

මද බෑවුම

- සමෝච්ච රේඛා දුරස්ව පිහිටා ඇතිවිට මද බෑවුම් හඳුනාගත හැකිය.



දළ බෑවුම

- සමෝච්ච රේඛා ආසන්නව විහිදී ඇතිවිට දළ බෑවුම් නැතිනම් ශීඝ්‍ර බෑවුම් හඳුනා ගත හැකිය.



මොහොර බෑවුම

- සමෝච්ච රේඛා ඉතාමත් ආසන්නව පිහිටා ඇත.
- ඇතැම් අවස්ථාවල සමෝච්ච රේඛා එකමත වැටෙන තරමට ආසන්න වේ.
- බොහෝ විට මේ ආශ්‍රිතව දිය ඇලි නිර්මාණය වේ.





උත්තල බෑවුම

- බෑවුම් ප්‍රදේශයේ ඉහළ කොටසේ - මද බෑවුමක් ද පහළ කොටසේ - දළ බෑවුමක් ද පිහිටයි.



අවතල බෑවුම

- බෑවුම් ප්‍රදේශයේ ඉහළ - දළ බෑවුමක්
- බෑවුම් ප්‍රදේශයේ පහළ - මද බෑවුමක්



11. කපොල්ල



- කඳු වැටි 2 ක් අතර හෝ කඳු වැටියක මුදුන් 2කක් අතර පිහිටි පහත් ප්‍රදේශයයි.
- මාර්ග ඉදිකිරීමේ දී මෙම කපොලු උපයෝගී කරගෙන ඇත.
- කපොල්ල අතරින් ගංගාවක් ගලා බසී නම් එය ජල කපොල්ලකි.

ක්‍රියාකාරකම

1 - 12 තෙක් දක්වා ඇති භූ ලක්ෂණ හඳුනාගෙන නම් කරන්න



12.10 රූපය

හරස්කඩ නිර්මාණය

හරස්කඩ යනු

- සිතියමක ස්ථාන දෙකක් සම්බන්ධ කරමින් අඳින ලද රේඛාවක් ඔස්සේ ,කිසියම් ප්‍රදේශයක භෞතික භූ දර්ශනයේ පැතිකඩ ස්වරූපය දැන ගැනීමට අඳිනු ලබන පරිමාණුකූල සැලැස්මකි.



හරස්කඩෙහි ප්‍රයෝජන

- යම් භූමි ප්‍රදේශයක භෞතික භූ දර්ශනය පැහැදිලිව හඳුනා ගැනීමට.
- සමෝච්ච රේඛාවලින් පෙන්වන භූ දර්ශනය පැතිකඩක් ඔස්සේ හඳුනා ගැනීමට.



හරස්කඩ නිර්මාණයට අවශ්‍ය දෑ..	හරස්කඩ නිර්මාණයේදී අවධානය යොමු කළයුතු කරුණු
▪ කඩදාසි තීරුවක්	❑ සිතියම්ගත ප්‍රදේශයේ උස
▪ අඩි රූලක්	❑ තිරස් හා සිරස් අක්ෂ
▪ දුඹුරු පැහැති පාට පැන්සල්	❑ පරිමාණ සටහන
▪ පැන්සලක් ▪ හරස්කඩ ඇඳීමට කොළයක්	❑ හරස්කඩ රේඛාව ❑ වර්ණ ගැන්වීම හා නම් කිරීම

හරස්කඩ නිර්මාණය සඳහා පියවර

1. සපයා ඇති සිතියමේ හරස්කඩ නිර්මාණය සඳහා A - B ලෙස නම් කර ඇති රේඛාව කෙරෙහි අවධානය යොමු කරන්න.



2. එම රේඛාවට සමාන රේඛාවක් ඇඳගත යුතුය.

3.එම පාදක රේඛාව දෙපස සිරස් රේඛා දෙකක් දෙකක් ඇඳ එහි සිරස් පරිමාණය ලකුණු කරන්න



4. හරස් පැතිකඩ නිර්මාණයට අවශ්‍ය කඩදාසි තීරුවක් සකසා ගන්න.

මෙම කඩදාසි තීරුව AB රේඛාවේ දිගට සමාන විය යුතුය.

එහි AB ලකුණු කරගන්න.



5. කඩදාසි තීරුව සිතියමේ AB රේඛාව මත තබා සමෝච්ච රේඛා කැපී ඇති ස්ථාන තිත් හෝ ඉරි මඟින් ලකුණු කර එම ස්ථානවල සමෝච්ච රේඛාවල වටිනාකම සටහන් කරන්න.



6. ලකුණු කර ගත් කඩදාසි තීරුව පරිමාණ සැලැස්මේ පාදක රේඛාව මත තබා මත තබා 100m රේඛාව මතට ගෙන, 100m පරිමාණ රේඛාවේ තිතකින් ලකුණු කරගන්න.

මෙලෙස 200,300m ආදී වශයෙන් ලකුණු කරන්න



7.මෙලෙස ලකුණු කරගත් 100,200,300m ආදී ලක්ෂ්‍ය එකිනෙක යා කරන්න. දුඹුරු පැහැයෙන් සේයා කරන්න.



හරස්කඩ නිර්මාණය තුළ අඩංගු විය යුතු දෑ

- මාතෘකාව දැක්වීම
- සිරස් අක්ෂය උඩ කෙළවරේ මීටර ලෙස දැක්වීම.
- සිරස් පරිමාණය අක්ෂයේ 0 දැක්වීම
- සිරස් හා තිරස් පරිමාණ දැක්වීම



ජලවහන ලක්ෂණ



1.ප්‍රධාන ගංගාව

- කඳුකර ප්‍රදේශයකින් පටන් ගන්නා කුඩා දියපාරක් ලෙස ගංගාවක්ආරම්භ වේ. ඊට අතු ගංගා ද එකතු වේ.

2. ගංගා මණ්ඩල

- ප්‍රධාන අතු ගංගාව හා ඊට එකතුවෙන අතු ගංගා , අතු ගංගා වලට එකතුවෙන කුඩා දියපහරවල් සියල්ල එක්ව ගත්විට ගංගා මණ්ඩලයක් ලෙස හැදින්වේ.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා මණ්ඩල 103 ක් පමණ දක්නට ලැබේ.



- ගංගාවන්ගෙන් බොහොමයක් මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වී පහත් තැනිතලා හරහා භූ විෂමතා අනුව ගලාගොස් දිවයිනේ විවිධ ස්ථානවලින් මුහුදට වැටේ.

- මේ හේතුවෙන් විවිධ ජලවහන රටා නිර්මාණය වේ.

3. පෝෂක ප්‍රදේශය

- ගංගාවක් ජලය ලබන හෙවත් පෝෂණය වන ප්‍රදේශය පෝෂක ප්‍රදේශයයි.
- පෝෂක ප්‍රදේශයේ දී අතු ගංගා රාශියක් එයට එකතු වීමෙන් එය පෝෂණය වේ.
- ලංකාවේ බොහෝ ගංගාවල පෝෂක ප්‍රදේශය මධ්‍යම කඳුකරයයි.





4. දියබෙත්ම

- ගංගා මණ්ඩල දෙකක් වෙන් කරන සීමාව නැතිනම් මායිම දිය බෙත්ම ලෙස හැඳින්වේ.
- එකම කඳුවැටියකින් ආරම්භ වී දෙපසට ගලා බසින විට කඳුවැටියේ මුදුන දියබෙත්ම බවට පත් වේ.

දියබෙත්ම



දියබෙත්ම



5.දිය ඇල්ල

- පටු ගැඹුරු නිම්න ඔස්සේ මොහොර බෑවුම් ප්‍රදේශ හරහා දිය පහරවල් ගලා යාම නිසා දිය ඇලි නිර්මාණය වේ.
- මධ්‍යම කඳුකරයේ මෙලෙස නිර්මාණය වූ දියඇලි රැසක් දක්නට ලැබේ.
- දුන්හිඳ / දියලුම / බඹරකන්ද

6. ගං දඟරය

- තැනිතලා ප්‍රදේශ වල පුළුල් නිම්න ඔස්සේ ගඟ ගලා යයි.
- එවිට ගලන ගංගාවේ භාරය තැනින්තැන තැන්පත් වී මාර්ගය ඇහිරී
නිසා ගංගාව වක්‍රාකාර මාර්ගයක ගමන් කිරීමෙන් ගං දඟර
නිර්මාණය වේ.



12.14 රූපය

7. වගුරු බිම්



12.17 රූපය

- ගංගා ආශ්‍රිත පහත් බිම්වල ජලය තැන්පත් වී වගුරු බිම් නිර්මාණය වේ.
- ගංගාවල ජල මාර්ග ඇහිරීම නිසා වගුරු බිම් ඇතිවේ.
- එමෙන්ම පහත් බිම් ප්‍රදේශවල වර්ෂා ජලය එකතු වීම නිසා ද වගුරු බිම් ඇතිවේ.



8. හැඩපලු ගංගා

- පහත් තැනිතලා ප්‍රදේශවල සෙමින් ගලායන ගංගාව මඟින් ගෙනෙන ද්‍රව්‍ය ගඟ මැද තැන්පත් වී කුඩා දූපත් වැනි ලක්ෂණ නිර්මාණය වේ.
- ඒවා හැඩපලු ගංගා ලෙස හඳුන්වයි.



12.15 රූපය



9. අපශාඛා

- පහත් බිම් හරහා සෙමින් ගලායන ගංගාව අතු කීපයකට බෙදී මද දුරක් ගොස් නැවත ප්‍රධාන ගංගාවට එකතු වන විට ඒවා අපශාඛා ලෙස හැඳින්වේ.
- ඇතැම් ගංගා මුහුදට වැටෙන ගංගා මෝය ආශ්‍රිතව ද මෙවැනි අපශාඛා දක්නට ලැබේ.
- මහවැලි ගඟ ත්‍රිකුණාමලයේ දී අපශාඛා කිහිපයක් ඔස්සේ මුහුදට වැටේ.





ජලවහන රටා

- අරීය
- ජලාකාර
- ශාඛීය

- ගංගාව ගලා බසින ප්‍රදේශයේ භූ විෂමතාව ,
- පාෂාණ සංයුතිය යම් ප්‍රදේශයක ජලවහන රටාව නිර්මාණයට හේතු වේ.



අරීය ජලවහනය රටාව

- උස් බිම් ප්‍රදේශයකින් ආරම්භ වී විවිධ දිශාවලට ගංගාව ගලා යාමෙන් අරීය ජලවහනය රටාව නිර්මාණය වේ.
- මධ්‍යම කඳුකරය හා ඒ වටා පිහිටි පහත් ප්‍රදේශවලින් සමන්විත ශ්‍රී ලංකාවේ සමස්ත ජලවහන රටාව ම අරීය ජලවහනය රටාවක් පෙන්නුම් කෙරේ.





ජලාකාර ජලවහන රටාව

- අතු ගංගා කොටු දැලක ආකාරයෙන් සෘජුකෝණීය රටාවකට ප්‍රධාන ගංගාව හා සම්බන්ධ වන විට ජලාකාර ජලවහනය රටාව නිර්මාණය වේ.
- ශ්‍රී ලංකාවේ නිරිත දිග තැනිතලා ප්‍රදේශයේ මෙම ජලවහන රටාව හඳුනාගත හැකිය.
- එම ප්‍රදේශයේ ඇති සමාන්තර හෙල්වැටි සහ ඒ ආශ්‍රිත ආයත නිම්න සහ තීර්යක් නිම්න මෙම ජලවහන රටාව නිර්මාණය වීමට හේතු වේ.





✓ ආයත නිම්න හා තීර්යක් නිම්න ඔස්සේ ගංගාව ගලා බසින විට මෙම ජලාකාර ජලවහන රටාව නිර්මාණය වේ.

උදා: කළු ගඟ / කැළණි ගඟ

ආයත නිම්නය

යම් ප්‍රදේශයක කඳුවැටි විහිදෙන දිශාවට සමාන්තරව විහිදෙන නිම්න ආයත නිම්න වේ.

තීර්යක් නිම්නය

කඳුවැටිය විහිදෙන දිශාවට ප්‍රතිවිරුද්ධව විහිදෙන නිම්න තීර්යක් නිම්න වේ.





3.4 රූපය

භූ රූප ලක්ෂණ

ශාඛීය ජලවහන රටාව

- ශාකයක අතු විහි දී ඇති ආකාරයට අතු ගංගා ප්‍රධාන ගංගාවට එකතු වන විට ශාඛීය ජලවහන රටාව නිර්මාණය වේ.
- ශ්‍රී ලංකාවේ බොහෝ ගංගා වල මෙම ජලවහන රටාව දක්නට ලැබේ.





වෙරළ භූ ලක්ෂණ

- වෙරළ ඉම ඛාදනය හා නිධි සාධනය
- රට අභ්‍යන්තරයේ සිට ගලා බසින ගංගා
- වෙරළ ඉමේ පාෂාණවල ස්වභාවය
- මුහුදු තරංගවල බලපෑම වෙරළ භූ ලක්ෂණ නිර්මාණයට හේතු වේ.

9.2 සිතියම - වෙරළ ලක්ෂණ

1. දූපත්

- සෑම දිශාවකින්ම ජලයෙන් වට වූ ගොඩබිමයි.
- ඩෙල්ෆ් , කයිට්ස් , නාගදීපය ,

2. කලපු

- සාගරය ගොඩබිම තුළට කා වැදීම නිසා පටු වැලිබිම් තීරුවකින් මුහුදින් වෙන්ව ඇත.
- නමුත් පටු විවරයකින් මුහුදට සම්බන්ධ වී ඇත.
- මීගමුව / මඩකලපුව /පුත්තලම



3.බොකු

- කලපුවකට වඩා වැඩි පුළුල් විවරයකින් සාගරය හා සම්බන්ධ වී ඇති ගොඩබිමට කාවැදුණු මුහුදු කොටසයි.
- කොඩ්ඩියාර් / වැලිගම / ආරුගම් බොක්ක

4. තුඩු

- වෙරළ තීරයේ සාගරය දෙසට නෙරා ගිය පටු ගොඩබිම් කොටස වේ.
- දෙවුන්දර තුඩුව / පේදුරු තුඩුව / සංගමන්කන්ද තුඩුව



ත්‍රිකුණාමලය

5. ගං මෝය

- ගංගාවක් මුහුදට වැටෙන ස්ථානය ගංගා මෝය ලෙස හැඳින්වේ.

- ගං මෝය ආසන්න වෙරළ තීරයේ - වැලිපර
- ගංගා මෝය ආසන්න ගොඩබිම ප්‍රදේශයේ - වගුරු බිම්

6.වැලිපරය

- මුහුදු රළ ගංගා යනාදිය මඟින් ගෙනෙන වැලි , වෙරළ තීරය දිගේ තැන්පත් වීමෙන් නිර්මාණය වන වැටි වැලිපර ලෙස හඳුන්වයි.



ස්වභාවික වෘක්ෂලතා

1. වනාන්තර / ලඳු කැලෑ



2. තණ බිම්



3.කඩොලාන

සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනීම

- මිනිසා විසින් භූමිය පරිහරණය කර ඇති ආකාරය සහ එහි නිර්මාණය වී ඇති ලක්ෂණ සංස්කෘතික ලක්ෂණ ලෙස හැඳින්විය හැකිය.

- භූමිය මත නිර්මාණය වී ඇති මිනිස් කටයුතුවල ව්‍යාප්තිය විවිධ සංකේත හා වර්ණ මඟින් හඳුනාගත හැකිය.

සංස්කෘතික ලක්ෂණ
- මායිම් වර්ග
- මාර්ග
- වගා බිම්
- සංචාරක තොරතුරු
- ජල සම්පාදනය
- විශේෂිත ගොඩනැඟිලි

මායිම් වර්ග

- 1 : 50,000 භූ ලක්ෂණ සිතියම්වල සියලුම පරිපාලන මායිම් රතු වර්ණයෙන් හා විවිධ සංකේතවලින් දක්වා ඇත.
- මීට රක්ෂිත අභය භූමි මායිම් ද ඇතුළත් වේ. නමුත් එය භෞතික පරිසරයට අයත් ලක්ෂණ වේ.
- මෙම මායිම් සිතියමේ දක්නට ලැබුණ ද භූමිය තුළ විද්‍යමාන නොවේ.
- පරිපාලන මායිම් වෙන් කරන සීමා බොහෝ දුරට ගංගා ,කඳුවැටි වැනි භෞතික ලක්ෂණ පදනම් කරගෙන ඇත.

මාර්ග

- මංමාවත් /දුම්රිය මාර්ග යන ශිර්ෂ යටතේ සංකේත මඟින් ඉදිරිපත් කර ඇත.





විශේෂ ගොඩනැඟිලි

- ✓ ස්ථිර ගොඩනැඟිලි - කුඩා කළු කොටුවකින්
- ✓ විශේෂ ගොඩනැඟිලි - තරමක් විශාල කොටුවකින් / නම ද ලියා ඇත.
- ✓ ඉදිකරන බිම් - ලා රතු පැහැයෙන්
- ✓ පොදු සේවා සපයන මධ්‍යස්ථාන , ආගමික සිද්ස්ථාන



සංචාරක තොරතුරු

- ✓ සංචාරකයින් ට අවශ්‍ය තොරතුරු ලෙස තානායම , හෝටලය , ඓතිහාසික ස්ථාන යනාදිය ද භූ ලක්ෂණ මඟින් ඉදිරිපත් කෙරේ.



ජල සම්පාදනය

- ජල සම්පාදනය යටතේ වැව් හා වාරි මාර්ග දක්නට ලැබේ.



වගා බිම්

- ✓ ගෙවතු වගා - කහ පැහැය
- ✓ වී වගාව - කොළ පැහැය
- ✓ තේ /රබර් /පොල් - කහ පැහැය මත කොළ පැහැ සංකේත



සිතියම් විවරණය

1. සංස්කෘතික හා භෞතික ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරමින් සිතියම් විවරණය කළ යුතුය.

නිදසුන්: භූ විෂමතාවය - මාර්ග රටාව / ජනාවාස ව්‍යාප්තිය / කෘෂි භෝග වගාව

2. සිතියම් විවරණයේදී ජන සමාජය තුළ ඇති සමාජයීය අනන්‍යතාවය පිළිබඳව ද අවබෝධයක් ලැබිය හැකිය.

3. පරිපාලන මායිම් තීරණය කිරීමේ දී බොහෝ විට භෞතික ලක්ෂණ යොදාගෙන ඇත.

සිතියම් නිර්මාණයේ පසුබිම හඳුනා ගත් ඔබට සිතියම් විවරණය කිරීමට (සිතියමෙහි ඇති තොරතුරු හඳුනා ගැනීමට හා විස්තර කිරීමට) සිතියම්ගත ප්‍රදේශය හා එහි විවිධ දිශාවන් හඳුනා ගැනීමට සිදු වේ.

ඒ අනුව සිතියමේ මායිම්, කෙළවර, අර්ධ හා කාර්තු හඳුනා ගැනීම වැදගත් ය. ඒ සඳහා පහත සඳහන් රූප රාමු හොඳින් අධ්‍යයනය කරන්න.

මායිම්



කෙළවර



අර්ධ

කාර්තු

සිතියම් ගත ප්‍රදේශයේ සීමා හා දිශාවන්

- මායිම් — උතුරු, දකුණු, නැගෙනහිර, බටහිර
- කෙළවර — ඊසාන, ගිනිකොන, නිරිත, වයඹ
- අර්ධ — උතුරු, දකුණු, නැගෙනහිර, බටහිර
- කාර්තු — ඊසාන, ගිනිකොන, නිරිත, වයඹ

1.1 භූ විෂමතාවය - මාර්ග රටාව

- තැනිතලා ප්‍රදේශයක සෘජු මාර්ග රටාවක් හඳුනාගත හැකිය.
- කඳුකර ප්‍රදේශවල වංගු සහිත මාර්ග රටාවක් හඳුනාගත හැකිය. බොහෝ විට ගංගා නිම්න ආශ්‍රිතව විහි දී ඇත.



1:50,000



9.3 සිතියම - භූ ලක්ෂණ සිතියමක ඇතුළත් වන සංස්කෘතික ලක්ෂණ

1.2 භූ විෂමතාවය - කෘෂි භෝග ව්‍යාප්තිය

- පහත් තැනිතලා ප්‍රදේශවල , ගංගා නිම්න ආශ්‍රිතව - පුළුල්ව විහිදුණු වී වගාව
- කඳුකර ප්‍රදේශවල ගංගා නිම්න ආශ්‍රිතව පටු දිගටි වී වගාව / හෙල්මළු වී වගාව
- තේ වගාව
- මධ්‍යම උසකින් යුතු කඳු බෑවුම්වල - රබර් වගාව
- වෙරළබඩ ප්‍රදේශවල පොල් වගාව
- වියළි කලාපීය ප්‍රදේශවල - ළඳු කැලෑ / හේන්වගාව

වෙරළබඩ ප්‍රදේශ



1:50,000

කඳුකර ප්‍රදේශ



1.3 භූ විෂමතාවය - ජනාවාස ව්‍යාප්තිය



- තැනිතලා ප්‍රදේශවල - පුළුල්ව පැතිරුණු ජනාවාස
- මාර්ග හා පටු බිම් තීරු දිගේ - රේඛීය ජනාවාස
- මංසන්ධි - පොකුරු ජනාවාස
- කඳුකර ප්‍රදේශවල - විසිරුණු ජනාවාස
- මිනිසාගේ ජීවන රටාව අනුව ද
  - වැව් ආශ්‍රිත- වැව් ගම්මාන
  - වෙරළාශ්‍රිත - ධීවර ගම්මාන
  - වතු ආශ්‍රිතව - වතු ගම්මාන

- මීට අමතරව ග්‍රාමීය ජනාවාස / නාගරික ජනාවාස ලෙස ද වෙන් වී තිබේ.
- උප තැපැල් කාර්යාල , අප්‍රධාන මාර්ග ,කරත්ත පාර , අඩිපාර යනාදිය මඟින් ග්‍රාමීය ජනාවාස හඳුනාගත හැකිය.

- නගරයක රෝහල් , ප්‍රධාන තැපැල් කාර්යාල ,උසාවි ,පොලීසි දක්නට ලැබේ.
- ප්‍රධාන මාර්ග ගණනාවක් ඒකරාශී වී ඇත.
- සමහර ස්ථානවල දුම්රිය මාර්ග ද දක්නට ලැබේ.
- මෙවැනි ප්‍රදේශ ඉදිකළ ප්‍රදේශ ලෙස රෝස පාට වර්ණයෙන් දක්වා තිබේ.

ඉදිකළ ප්‍රදේශ

වැව් ගම්මාන



ග්‍රාමීය ප්‍රදේශයක ජනාවාස



කඳුකර ප්‍රදේශයක ජනාවාස